# කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව
# முகாமைத்துவக் கணக்காய்வுத் திணைக்களம்
# DEPARTMENT OF MANAGEMENT AUDIT

මුදල් අමාත්‍යාංශය | நிதி அமைச்சு | MINISTRY OF FINANCE
මහලේකම් කාර්යාලය, කොළඹ 01 | செயலகம், கொழும்பு 01 | The Secretariat, Colombo 01


මගේ අංකය / எனது இல / My No: DMA/AMC/M/2022/2
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2022.05.04

**කළමනාකරණ විගණන මාර්ගෝපදේශ DMA - 1/2022**

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්, රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධානීන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, දිස්ත්‍රික් ලේකම්වරු
මගින්,

ප්‍රධාන අභ්‍යන්තර විගණක/අභ්‍යන්තර විගණක/ පළාත් අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ

**<u>රාජ්‍ය වියදම් පාලනය කිරීම</u>**

උක්ත කරුණ සම්බන්ධව 2022.04.26 දිනැතිව නිකුත් කරන ලද මුදල් අමාත්‍යාංශයේ ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 කෙරෙහි ඔබගේ කාරුණික අවධානය යොමු කිරීමට කැමැත්තෙමි. ඒ අනුව එම චක්‍රලේඛය මගින් සියලුම රාජ්‍ය ආයතනවල රාජ්‍ය වියදම් ඉදිරියේ දී පාලනය කිරීම සඳහා අනුගමනය කළ යුතු විධිවිධානයන් පෙන්වා දී ඇත.

02. එබැවින් මේ පිළිබඳව ඔබගේ විශේෂ අවධානය යොමු කර ඔබ ආයතනයේ ඉදිරි කටයුතු සිදු කිරීමේ දී එම චක්‍රලේඛයේ විධිවිධානයන් මගින් පෙන්වා දී ඇති ආකාරයට රාජ්‍ය මුදල් ඉතා වගකීමෙන් හා පිරිමැස්මෙන් යුතුව පරිහරනය කරනු ලබන බවට කාර්තුමය වශයෙන් පරීක්ෂාවට ලක් කල යුතුයි. එහි දී දැනටමත් ඔබ විසින් සකස් කර අනුමත කර ඇති 2022 වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්මේ ඇතුලත් කරුණුවලට අමතරව මෙම විශේෂ විගණන පරීක්ෂාව සිදු කර වාර්තා කල යුතුයි.

03. තව ද උක්ත චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව තම ආයතනය හා ඒ යටතේ ඇති අනෙකුත් ආයතන ක්‍රියා කර ඇති ආකාරය පිළිබඳව ඔබ විසින් සකස් කරනු ලබන විශේෂ විගණන වාර්තාවේ සඳහන් කරුණු මෙම වර්ෂයේ එළඹෙන කාර්තුවල පවත්වනු ලබන විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වලදී න්‍යාය පත්‍රයේ කරුණක් ලෙස ගෙන සාකච්ඡා කල යුතුය.

04. ඒ අනුව මෙම අවස්ථාවේ පවතින අභියෝගකාරී වාතාවරණය පාලනය කර ගනිමින් රාජ්‍ය වියදම් කළමනාකරණය කර ගැනීම සඳහා උක්ත චක්‍රලේඛය ප්‍රකාරව තම ප්‍රධාන ගණන් දීමේ නිලධාරීවරයාට, ගණන් දීමේ නිලධාරියාට හෝ ආයතන ප්‍රධානියාට තම ආයතනයේ අභ්‍යන්තර පාලන ක්‍රියාවලිය ශක්තිමත් කරමින් අවශ්‍ය සහාය ලබා දෙන ලෙස ද වැඩිදුරටත් දන්වා සිටිමි.

එස්.ජ්. චන්ද්‍රිකා කුලතිලක
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත:- අධ්‍යක්ෂක ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව - කා.දැ.පි.


කාර්යාලය / அலுவலகம் / Office: 2484816, 2484500, 2484600, 2484700
අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் நாயகம் / Director General: 2484543
ෆැක්ස් / பெக்ஸ் / Fax: 2449496
වෙබ් අඩවිය / வெப் சைட் / website: www.treasury.gov.lk